# 8 ශ්‍රේණිය

# අභිරූපණ

• අභිරූපන යනු සංවාද භාවිත නොකර ආංගික සහ සාත්ත්වික අභිනය මගින් කිසියම් සිද්ධියක් හෝ අවස්ථාවක් නිරූපණය කිරීමයි.
එය ප්‍රේක්ෂකයාට කුතුහලය දනෙන පරිදි ඉදිරිපත් කළ යුතු වේ.
මෙම රංගනය සාමාන්‍ය නිරූපණයට වඩා තරමක් අතිශයෝක්තියෙන් ඉදිරිපත් කරයි.

• චලනවල ද යම්කිසි රිද්මයානුකූල බවක් තිබේ.
• අභිරූපණයේදී ශිල්පියා වෙස්ගන්වන විශේෂ ක්‍රමයක් ද ඇත.

 

•අභිරූපණ රංගනයක් සඳහා විවිධ අත්දැකම් පදනම් කරගත හැක.

•ශිල්පියා කිසිදු විටක සැබෑ ලෝකයේ ද්‍රව්‍ය පරිහරණය නොකර හිස් අවකාශයේ සියලුම ද්‍රව්‍යයන්හි හැඩය, බර, ප්‍රමාණය පැහැදිලි ලෙස මවාපායි.

•අභිරූපණ ශිල්පියා කිසියම් අවස්ථාවක් යම්කිසි ගැටුමක් සහිත ක්‍රියාකාරිත්වයක් ගොඩ නැගෙන අයුරින් ද නිර්මාණ කළ යුතු වේ.

• අභිරූපණ රංගනයක් නිර්මාණය කරගැනීමේ දී විශේෂයෙන් ම මිනිස් සිරුර භාවිතය තුළින් මවා පෑමට හැකි ආකාරයේ අවස්ථාවන් හා සිදුවීම් තෝරාගත යුතු ය.

•භාවිත කරනු ලබන ඇඳුම්වල ස්වභාවය ද වර්ණය ද ශිල්පියා වඩාත් කැපීපෙනීමට හේතු වන අයුරින් යොදාගනී. චරිතයේ ස්වභාවයට අනුව ඇඳුම් භාවිත කරන්නේ නැත.

•ඉදිරිපත් කරනු ලබන අභිරූපණ රංගය වඩාත් තීව්‍ර කිරීමට සහ අර්ථවත් කිරීමට රංගයට අදාළ ශබ්ද සහ නාදයන් (සංගීතය) ඇතැම් විට භාවිත වේ.





මාධවී ඉඹුල්දෙණිය
කෑ / දෙහි /වහරක මහ විද්‍යාලය